# ජාත්‍යන්තර විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය 2018 මැයි 17




## සැමට කෘතිම බුද්ධියේ යහපත් භාවිතය

සෑම වසරකම මැයි 17 වන දින ලොව පුරා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සාමාජික රටවල් ජාත්‍යන්තර විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය සමරයි.

කෘතිම බුද්ධිය හෝ Artificial Intelligence (AI) , ජනතාවගේ ජීවිත වලට සුවිශාල බලපෑමක් ඇති කරමින් මධ්‍යස්ථ අවධියක සිටී. කෘතිම බුද්ධියේ භාවිතයට ගත හැකි සම්පත් මත එය පෙර නොවූ විරූ වේගයකින් ප්‍රතිලාභ සලසමින් සංවර්ධනය වෙමින් පවතී. කෘතිම බුද්ධිය අපට බොහෝ අවස්ථා මෙන්ම අභියෝග ගෙන එයි. කෘතිම බුද්ධිය නිසා අපගේ ආර්ථිකය සහ සමාජය බෙහෙවින් වෙනස් වනු ඇත.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂිත නියෝජිතායතනය වශයෙන් සිය කාර්යභාරය තුළ කෘතිම බුද්ධියේ ප්‍රතිලාභ සෑම දෙනාටම සැපයීම පිණිස කෘතිම බුද්ධිමය සංවර්ධන පහසුකම් සැලසීමෙහිලා විද්වත් පරිසරය සහ ප්‍රජාව, පර්යේෂකයන් , කර්මාන්ත, පරිපාලනමය , රාජ්‍ය  සහ  එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන මෙන්ම වෙනත් පාර්ශවකරුවන් සහ හවුල්කරුවන් සමඟ කටයුතු කිරීමට අපේක්ෂා කරයි.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය ජාත්‍යන්තර විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය 2018 සැමරීමෙහිලා එක්වන ලෙස ඔබට ආරාධනය කරයි !

හූලින්  ෂාහෝ

**මහලේකම් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය**

ජාත්‍යන්තර විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනයේ 2018 තේමාව  සැමට කෘතිම බුද්ධියේ යහපත් භාවිතය වන අතර එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක වේගවත් කිරීම පිණිස කෘතිම බුද්ධිමය පහසුකම් සැපයීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත.

මෑත වසර වලදී කෘතිම බුද්ධිය තාක්ෂණයේ කැපී පෙනෙන ප්‍රගතියක් අත් කරගෙන ඇති අතර විශාල දත්ත (Big Data), යාන්ත්‍රණ ඉගෙනුම් (Machine Learning), පරිගණක බලය (Computing Power), ගබඩා ධාරිතාවය (Storage Capacity) සහ ක්ලවුඩ් කම්පියුටින් (Cloud Computing) යනාදී ක්ෂේත්‍රයන් සඳහා විශාල දායකත්වයක් ලබා දී ඇත. සෞඛ්‍යය ආරක්ෂණය , අධ්‍යාපනය , මුදල් , කෘෂිකර්මය, ප්‍රවාහනය සහ වෙනත් සේවා රාශියක් වැඩිදියුණු කිරීමෙන් ජනතාවට වඩා යහපත් ජීවිතයක් ගත කිරීමට ඉවහල් වන පරිදි භාවිතා කරන ප්‍රායෝගික මෙවලම් සහ භාවිතාවන්වල ප්‍රධාන සංරචකයක් වශයෙන් කෘතිම බුද්ධිමය තාක්ෂණය දැනටමත් පිළිගැනේ.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සාමාජිකත්වයට සහ අනෙකුත් ප්‍රධාන පාර්ශවකරුවන්ට 2030 වන විට තිරසාර සංවර්ධන ඉලක්කයන් වේගවත්ව සාක්ෂාත් කර ගැනීමට කෘතිම බුද්ධිය ඉවහල් වන ආකාරය පිළිබඳව අවධානය යොමු කිරීමට 2018 වසරේ තේමාව ඉඩ සලසා දෙයි.

### ජාත්‍යන්තර විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය පිළිබඳව

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ බිහිවීම සහ ප්‍රථම ජාත්‍යන්තර ටෙලිග්‍රාෆ් සමුළු සංවත්සරය මැයි 17 සමරනු ලබයි.

### ජාත්‍යන්තර විදුලි සංදේශ දිනය

1969 වසරේ මැයි 17 වන දින සිට ජාත්‍යන්තර විදුලි සංදේශ දිනය වාර්ෂිකව සමරා ඇත. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (International Telecommunication Union -ITU) බිහිවීම සහ 1865 ප්‍රථම ටෙලිග්‍රාෆ් සමුළුව සැමරීම ද මින් සනිටුහන් කෙරේ. එය 1973 වසරේ මලගාවේදී පවත්වනු ලැබූ රාජ්‍ය තාන්ත්‍රික සම්මේලනයකදී කෙටුම්පත් කරන ලද්දකි.

### ජාත්‍යන්තර තොරතුරු සමාජ දිනය

2005 වසරේ නොවැම්බර් මාසයේදී රැස්වූ ජාත්‍යන්තර තොරතුරු තාක්ෂණ සමාජය (WSIS) විසින් මැයි 17 වන දිනය ජාත්‍යන්තර තොරතුරු තාක්ෂණ දිනය වශයෙන් නම් කරන ලෙස  එක්සත් ජාතීන්ගේ මහා සමුළුවෙන්  කරන ලද ඉල්ලීමකට අනුව  තොරතුරු තාක්ෂණයේ වැදගත්කම පිළිබඳව අවධානය යොමු කිරීමේ අරමුණින් 2006 වසරේ සිට එක්සත් ජාතීන්ගේ මහා සමුළුව විසින් සෑම වසරකම මැයි 17 වන දින ජාත්‍යන්තර තොරතුරු තාක්ෂණ සමාජ දිනය ලෙස නම් කරන ලදී.

### ජාත්‍යන්තර විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ සමාජ දිනය

2006 නොවැම්බර් මාසයේදී තුර්කියේ පවත්වන ලද ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ රාජ්‍යතාන්ත්‍රික සමුළුවේදී ලෝක විදුලි සංදේශ දිනය සහ ජාත්‍යන්තර තොරතුරු තාක්ෂණ දිනය එකම දිනයේදී එනම් මැයි 17 වැනි දින ජාත්‍යන්තර විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ සමාජ දිනය වශයෙන් සැමරීම ආරම්භ විය.

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08 , ශ්‍රී ලංකාව**
**www.trc.gov.lk**